**ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය - 2019**

**--------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ඉකුත් වර්ෂ වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි සම්බන්ධයෙන් වන ගැලපුම් අතීතානුයෝගීව ගලපා නැවත ප්‍රතිෂ්ඨනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද රු.26,848,148 ක පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් නැවත ගලපා ඉකුත් වර්ෂයේ ශේෂයයන් නැවත ප්‍රතිෂ්ඨනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද මධ්‍යස්ථානයේ ගොඩනැගිලිවල වටිනාකම වූ රු.56,007,002 ක අගය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2015 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉඩම් ගොඩනැගිලි වටිනාකම වෙන් වෙන්ව තක්සේරු කිරීම සිදු කරන ලද බවත් එම තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව 2020 වර්ෂයේ සිට ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව සටහන් කරන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 08 වන වගන්තිය ප්‍රකාරව කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමින් යුත් පාරම්පරික වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෝ හෙළි දරව් කර නොතිබුණි. | මේ සම්බන්ධව කෞතුකාගාර දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගත් බවත් මේ සම්බන්ධයෙන් අත්දැකීම් ඇති කමිටුවක් වෙත ඉදිරිපත් කර මූල්‍යම තක්සේරුවක් ලබා ගැනීමට අපේක්ෂිත බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 වර්ෂයේදී මධ්‍යස්ථානය විසින් ජේ.ආර්. ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමැති අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000 ක් ආයෝජනය කර තිබූ අතර, එම සමාගමේ මෙහෙයුම් කටයුතු 2008 වර්ෂයේ සිට අත්හිටුවා තිබුණි. ආයතනය වසා දමා වසර 11 ක් ගත වී තිබුණ ද මෙම ආයෝජනයෙන් රු.700,000 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ අතර ඉතිරි රු.4,300,000 ක ශේෂය දීර්ඝ කාලීන ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම මෙම ආයෝජනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ද නොතිබුණි. | මෙම ආයෝජනය දිගු කාලීන ආයෝජන වලින් ඉවත් කිරීම සඳහා 2015 වර්ෂයේදී පාලක මණ්ඩල අනුමැතිය ලැබුණු බවත් අදාල ආයෝජන මුදල ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බවත් අදාල අනුමැතිය ලැබුණු පසු ගිණුම් තුලින් ඉවත් කරන බව | භාණ්ඩාගාරයේ අනුමැතිය මත ඉදිරි කටයුතු කල යුතු අතර සමාගම ඈවර කිරීම සමාගම් පනතට අනුව සිදු කල යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් තොග වටිනාකම හා ඊට අදාල උපලේඛන අනුව පුස්තකාල පොත් තොග වටිනාකම | 4,371,424 | 4,700,000 | 328,576 | ඉදිරි වර්ෂයේදී පුස්තකාල පොත් තොග වටිනාකම නිවැරදිව ඉදිරිපත් කරන බව | අදාළ උපලේඛන සමඟ සසඳා වත්කම් ශේෂවල ගැලපීම් කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බාහිර ආයතන හා පුද්ගලයන්ට කුලියට දී තිබුණු ගොඩනැගිලි වෙනුවෙන් වර්ෂ 03 කට වඩා පැරණි රු.3,514,756 ක කුලී මුදලක් අයවිය යුතුව තිබුණු අතර මධ්‍යස්ථානයට එම කුලි මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අයවීමට ඇති කුලි මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1988 අංක 77 දරන ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 4 (I) ඇ වගන්තිය | 1996 වර්ෂයේ සිට මධ්‍යස්ථානයට ලැබී තිබුණු Umatics හා අනෙකුත් ශ්‍රව්‍ය දෘශ්‍ය දත්ත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම හඬ පට සහ වීඩියෝපට ඩිජිටල්කරණය සඳහා උපදෙස් ලබා ගෙන ඇති බවත් පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන එම කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.2 ඡේදය සහ 4.2.3 ඡේදය | පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණු බැවින් මාසික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම හා කාර්යසාධන වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | අතිගරු ජනාධිපතිතුමා අග්‍රාමාත්‍යතුමා කථානායකතුමා විපක්ෂ නායකතුමා ඇතුළු ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය තුල සිටින අතිශය කාර්යබහුල පිරිසකගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පවතින හෙයින් පාලක මණ්ඩල රැස්වීමක් 2019 ජනවාරි 01 දින සිට 2020 පෙබරවාරි 28 දින දක්වා වූ කාල පරාසය තුල දී පැවැත්වීමට හැකියාව නොලද නිසා මාසික මූල්‍ය ප්‍රකාශන සහ කාර්යය සාධන වාර්තා සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බව. | චක්‍රලේඛය ප්‍රකාරව පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කල යුතුය. |
| (ii) 5.2.5 ඡේදය | පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණු බැවින් වාර්ෂික අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. | 2019 වර්ෂයේ පාලක මණ්ඩල රැස්වීම් නොපැවැත්වූ හෙයින් මේ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත නොහැකි වූ බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය | රු.250,000 ඉක්මවන කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් තිබියයුතු වුවද රු.995,650 ක් සහ රු.333,600 ක් වටිනා කොන්ත්‍රාත්තු දෙකක් සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ඉදිරියේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඊ) 2015 මැයි 25 දිනැති PED 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 3.5 වගන්තිය | නිල වාහනයක් හිමි නිලධාරියෙකු විසින් සමාලෝචිත වර්ෂයේදී සංචිත වාහනයක් පෞද්ගලික කාර්යයන් සඳහා කි.මී.6229 ක් ධාවනයකර ඒ සඳහා රු.136,203 ක ඉන්ධන මධ්‍යස්ථානය විසින් දරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව | චක්‍රලේඛ නියමයන් හා සීමාවන්ට යටත්ව ඉන්ධන දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ii) 3.8 වගන්තිය | නිල වාහන හිමි නිලධාරියෙකුගේ පෞද්ගලික ගමන් සඳහා යොදාගත් රියදුරුගේ අතිකාල හා අනෙකුත් දීමනා රු.202,473 ක් මධ්‍යස්ථානය විසින් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව අතිකාල දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. |
| (උ) 2016දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/01(2016 සංශෝධිත) චක්‍රලේඛයේ 3.1 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනට පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි . | ඉදිරි වර්ෂයේ සිට චක්‍රලේඛ ප්‍රකාරව පොත් පිළිබඳ සමීක්ෂණයක් කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකල යුතුය. |

**1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 ජූලි 06 දිනැති ආදායම් බදු කොමසාරිස් ජනරාල්ගේ අංක SEC/2015/15 දරන චක්‍රලේඛය සහ 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/60 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව දෙවන සේවා යෝජකත්වය යටතේ ලේකම් ජනරාල්වරයාගෙන් රු.166,390 ක් උපයන විට ගෙවීමේ බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | වාරික වශයෙන් මෙම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට සටහන් කර ගන්නා ලද බව | බදු රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,110,635 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,176,004 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,065,369 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි වියදම රු.720,162 කින් ද අලුත් වැඩියා හා නඩත්තු වියදම් රු.647,943කින් ද වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

මධ්‍යස්ථානයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 7.6:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 7.9:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 7.4:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 7.6:1 ක් විය. ජංගම වත්කම් වලින් සියයට 77 ක් කෙටිකාලීන ආයෝජන නියෝජනය කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික කුලී තක්සේරුවක් ලබා නොගෙන කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ඉහල වෙළඳපල වටිනාකමක් සහිත භූමියක පිහිටි මෙම කාර්යාල පරිශ්‍රය වර්ග අඩියක් මාසිකව රු.67 සිට රු.165 ක් අතර වූ ඉතා අඩු මිල ගණන් යටතේ | ඉදිරියේ දී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරු වාර්තාවක් ලබා ගෙන වර්ග අඩියක් සඳහා අය කරනු ලබන කුලී මුදල සංශෝධනය කිරීමට | වර්තමාන වෙළඳ තක්සේරු වටිනාකමට අනුරූපවන ලෙස කුලී ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| කුලියට ලබා දී තිබුණ ද එම මිල ගණන් වර්තමාන වෙළඳ වටිනාකම්වලට අනුරූපවන ලෙස, සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත බව. | |
| (ආ) මධ්‍යස්ථානය විසින් කුලි පදනම මත ලබා දී තිබුණු ගොඩනැගිලි හතරකට අදාල කුලී කරුවන් සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුම්වල වලංගු කාලය අවසන් වී තිබුණද කුලී ගිවිසුම්වල කාලය දිර්ඝ කිරීමකින් තොරව එම කුලී කරුවන් පෙර කුලී ගාස්තු යටතේ ගොඩනැගිලිවල රැඳී සිටින බව නිරීක්ෂණය විය . | මෙම ආයතන සඳහා බඳු ගිවිසුම් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව | විධිමත් පරිදි ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කල යුතුය. |
| ඇ) 2002 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු.9,725,000 ක් ආයෝජනය කර තිබුණු අතර එම බැංකුව වසා දමා එම බැංකුවේ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරාගෙන වගකීම් පියවීමට කටයුතු කර තිබුණි. මෙම නිසා මධ්‍යස්ථානයට රු.972,500 ක පොලී මුදලක් අහිමි වී තිබුණු අතර පාලක මණ්ඩල අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් තැන්පතු මුදල හා පොලියේ එකතුව වු රු.14,101,250 ක මුදල 2020 සැප්තැම්බර් 30 දින වන විටත් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම මුදල් නැවත ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව | නීතිමය බාධාවන් සමථයකට පත්කර ගැනීමට කටයුතු කර අදාළ බැංකු තැන්පතු නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමණාකරනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් රු.547,100 ක් වූ ආරක්ෂිත උපකරණ 3 ක් ව්‍යාජ ලෙස ලියාපදිංචි කර තිබුණු ආයතනයකින් මිලදී ගෙන තිබුණි. මෙම නිසා මෙම උපකරණවල දෝෂයන් වාර්තා වුවද ඒවා යළි නිවැරදි කර ගැනීමට නොහැකි වී තිබුණි. | එකඟ වන බවත් ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී නිතී රීති සහ රෙගුලාසි වලට අනුව කටයුතු කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමණාකරනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 10 සම්පූර්ණ කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කරන බව | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.8,735,000 ක් වටිනා ඉලක්කගත කාර්යයන් 23 න් රු.8,385,000 ක ඇස්තමේන්තු ගත වටිනාකමින් යුත් කාර්යයන් 22 ක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉටු නොකළ කාර්යයන් 22 න් 19 ක්ම 2016 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු කාර්යයන් බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන බව | ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ගත වටිනාකම් සහ සත්‍ය වටිනාකම් අතර සියයට 3 සිට සියයට 867 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | අපේක්ෂා නොකළ වියදම් 2019 වර්ෂයේදී ඇති වු නිසා මෙම තත්වය ඇති වු බව | අයවැය සකස් කිරීමේදී වාර්ෂිකව ඉටුකල යුතු ප්‍රමුඛතා කාර්යයන් නිශ්චිතව හඳුනා ගෙන අයවැය සකස්කර එම කාර්යයන් නියමිත කාල වකවානු තුළ ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |